**කොලොන්න ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොලොන්න ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කොලොන්න ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඒ) ඡේදයේ (i), (ii), (iii) නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | | | ------------ |
| (අ) | වෙන්දේසි කරන ලද වාහන 02ක වටිනාකම රු.315,000ක් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | පුස්තකාල පොත්, යන්ත්‍ර උපකරණ හා වැහිපීලි පිරිවැය රු.1,173,146ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2020 වර්ෂයේ සිදුකරන ලද තක්සේරුව අනුව වූ මෝටර් රථවල වටිනාකමට වඩා රු.8,209,537ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන අනුව එම මෝටර් රථවල වටිනාකම දක්වා තිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ඈ) | සේවක ණය පොලී ආදායම් රු.206,825ක් සදොස් ලෙස සේවක ණය ගිණුම බැරකර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ස්ථාවර තැන්පත් පොලී රු.234,002ක් පොලී ආදායම් ගිණුම බැර කරනු වෙනුවට ලැබිය යුතු තැන්පත් පොලී ගිණුමට බැර කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සාවද්‍ය ජර්නල් සටහන් තැබීම නිසා හිඟහිටි ප්‍රාග්ධන ආධාර ශේෂය රු.10,581,262කින් වැඩි වී තිබුණි. | -එම- | -එම- |
| (උ) | ඉකුත් වර්ෂයන්ට අදාළ කර්මාන්ත ණයගැතියෝ රු.25,633,709ක් 2023 වර්ෂයෙහි වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | ඉකුත් වර්ෂයට අදාළ සම්ප්‍රේෂණ කුළුණු ආදායම හා දැන්වීම් පුවරු ගාස්තු රු.70,850ක් 2023 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | –එම- | -එම- |
| (එ) | ගිණුම් විෂයයන් 07ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එම ශේෂ අතර රු.1,093,303ක වෙනසක් විය. | –එම- | –එම- |

| | | | |
|---|---|---|---|
| (ඒ) | 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණු පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ද නිවැරදි කර නොතිබුණි. | -එම- | -එම- |
| (i) | කොම්පෝස්ට් අංගනයක පිරිවැය රු.573,787ක් වැඩියෙන් ප්‍රාග්ධනීත කර තිබුණි. | -එම- | -එම- |
| (ii) | රු.1,164,487ක් වූ වාහන අංගනය, යන්ත්‍ර සූත්‍ර හා ලී බඩු වටිනාකම ප්‍රාග්ධනීත කර නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | කම්කරු දෛනික වැටුප් ගෙවීම රු.110,525ක් ලැබිය යුතු වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.48,222,679ක් වූ හිඟහිටි ප්‍රාග්ධන ආධාර ශේෂයට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) පරිදි, 1998 වර්ෂයේදී ලබා දී තිබුණු රු.33,000ක අත්තිකාරමක් පියවා නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,517,080ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,947,409ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 825,300 | 1,265,384 | 1,326,984 | 299,419 | 753,700 | 1,055365 | 1,118,915 | 360,729 |
| කුලී | 5,920,568 | 3,972,898 | 4,103,143 | 276,034 | 5,165,914 | 3,624,433 | 3,494,522 | 2,443,126 |
| බලපත්‍ර ගාස්තු | 5,704,200 | 3,560,234 | 3,560,234 | - | 1,115,500 | 973,580 | 973,580 | - |
| වෙනත් ආදායම් | 7,746,542 | 8,398,301 | 8,398,301 | - | 3,316,542 | 3,316,542 | 1,046,258 | - |
| | 20,196,610 | 17,196,817 | 17,388,662 | 575,453 | 10,351,656 | 8,969,920 | 6,633,275 | 2,803,855 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී ගැසට් කළ සංවර්ධිත ප්‍රදේශවලින් වරිපනම් බදු අයකිරීමට 2023 දෙසැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි. | එම ප්‍රදේශවල දේපළ තක්සේරු කිරීමෙන් පසුව වරිපනම් අය කරමි. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකළ යුතු වේ. |
| (ආ) | සභාව සතු බිම්බදු ඒකක 29ක් 1983 වර්ෂයේ සිට ගිවිසුම්ගත වීමකින් තොරව ලබා දී තිබුණි. 2010 වර්ෂයෙන් පසුව එම දේපළවල තක්සේරු ගාස්තු ප්‍රතිශෝධනය කිරීමට ද කටයුතු කර නොතිබුණි. | බිම්බදු තක්සේරු නව ගාස්තු නියම කළ පසු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | ගිවිසුම්ගත වීමට හා තක්සේරු ගාස්තු ප්‍රතිශෝධනයට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2021 වර්ෂයේ ඉදිකර තිබුණු සම්ප්‍රේෂණ කුළුණු 04ක් හා ගොඩනැගිලි අයදුම්පතක් සඳහා පෙරසැරි ගාස්තු රු.76,259ක් අඩුවෙන් අයකර තිබුණි. | අදාළ අතුරු ව්‍යවස්ථාවට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී එය ගැසට් කළ පසු ඒ අනුව ගාස්තු අය කෙරේ. | නියමිත ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෛනිකව රැස් කරන දිරන කසළ ප්‍රමාණය දළ වශයෙන් කිලෝග්‍රෑම් 140ක් පමණව තිබියදී, රු.1,575,000කට කිලෝග්‍රෑම් 6,000ක ධාරිතාවයෙන් යුතු හලර් යන්ත්‍රයක් 2021 දෙසැම්බර් මස මිලදී ගෙන තිබුණි. ප්‍රමාණවත් ලෙස කසළ රැස් නොවීම නිසා වර්ෂ 02කට එක් වතාවක් පමණක් එය ක්‍රියාත්මක කර තිබුණි. එමෙන්ම, එකතුව රු.1,520,000ක් වූ ව්පර් යන්ත්‍රය හා බේලර් යන්ත්‍රය වර්ෂ කිහිපයක සිට අභාවිතව පවතී. | කසළ කළමනාකරණ කටයුතු ඉදිරියේදී පුළුල් කිරීමට සිදුවන බැවින් ඒ අනුව යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන ඇත. දැනට කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කර ඇති අතර බේලර් යන්ත්‍රය ද භාවිතයට ගනු ලබයි. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළයුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොලොන්න ජල ව්‍යාපෘතියේ ජලය බීමට නුසුදුසු බැවින් එහි ජල සැපයුම විෂබීජානුහරණය කිරීමටත්, ජල ගබඩා ස්ථාන සතියකට වරක් පිරිසිදු කිරීමටත්, කොලොන්න සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් දී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. බුළුතොට ජල ව්‍යාපෘතිය සඳහා 2017 පෙබරවාරි මාසයෙන් පසුව ජල තත්ත්ව පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතිය මඟින් ලබා දෙන ජලය පානයට නුසුදුසු බැවින් සෞඛ්‍යාරක්ෂිත ක්‍රම අනුගමනය කරන ලෙස ජල පාරිභෝගිකයින් දැනුවත් කර ඇත. කොලොන්න ප්‍රදේශයට ජලපවාහන මණ්ඩලය මඟින් ද පානීය ජල පහසුකම් ලබා දී ඇත. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් අනුව කටයුතු කළයුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොලොන්න මහජන වැසිකිළිය පැවැති රූඩ් 02ක පමණ ඉඩම අත්හැර දමා තිබීමෙන් අනවසරකරුවෙකු විසින් අත්පත් කර ගැනීමට කටයුතු කරමින් සිටී. | ඉඩම් මිනුම් කටයුතු අවසාන වීමෙන් පසු නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කෙරේ. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කළයුතු වේ. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාර්ග 02ක රු.1,926,442ක් වැයකරමින් සිදුකළ කොන්ක්‍රීට් වැඩවල නියමිත ප්‍රමිතිය, තත්ත්ව පරීක්ෂණ මඟින් තහවුරු කරගෙන | කාර්මික නිලධාරිගේ අධීක්ෂණය ලැබී ඇත. ඒ නිසා නැවත පරීක්ෂණයක් සිදු කිරීම අවශ්‍ය නොවේ. | කොන්ක්‍රීට් වැඩ සඳහා තත්ත්ව පරීක්ෂණ සිදුකළ යුතු වේ. |

නොතිබුණි.